**<u>බලංගොඩ නගර සභාව</u>**
**<u>රත්නපුර දිස්ත්‍රික්කය</u>**

1. **මූල්‍ය ප්‍රකාශන**

-----------------

1.1 **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
**------------------------------**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 28 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 30 දින ද විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 ජුනි 27 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය

--------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බැලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2015දෙසැම්බර් 31 දිනට බලංගොඩ නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**
------------------------------------------

1.3.1 **ගිණුම්කරණ අඩු පාඩු**
------------------------
මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2015 දෙසැම්බර් 31 දිනට තොග ලේඛනය අනුව රු.1,824,729 ක් වූ අවසන් තොගය රු.3,255,748ක් ලෙස ගිණුම් ගත කිරීමෙන් අවසන් තොගය රු.1,431,019ක් වැඩියෙන් ගිණුම් ගත කර තිබුණි.

(ආ) 2015 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු රු.484,636 වූ එකතු කල අගය මත බදු රු.2,702,585ක් ලෙස ගිණුම් ගත කිරිමෙන් ගෙවිය යුතු එකතු කල අගය මත බදු රු.2,217,949ක් වැඩියෙන් ගිණුම් ගත කර තිබුණි.

(ඇ) 2015 දෙසැම්බර් 31 දිනට දේශීය ණය හා සංවර්ධන අරමුදලට ගෙවිය යුතු රු.93,114,545ක් වූ ණය ශේෂය රු.92,902,663ක් ලෙස ගිණුම්ගත කිරිමෙන් ගෙවිය යුතු ණය රු.211,882ක් අඩුවෙන් ගිණුම් ගත කර තිබුණි.

(ඈ) 2015 දෙසැම්බර් 31 දිනට වරිපනම් බදු ලේඛනය අනුව රු.4,628,151ක් වූ ලැබිය යුතු වරිපනම් රු.4,611,698ක් ලෙස ගිණුම්ගත කිරිමෙන් ලැබිය යුතු වරිපනම් බදු රු.16,453 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඉ) 2015 දෙසැම්බර් 31 දිනට අත්තිකාරම් ලේඛණය අනුව ශේෂය වූ රු.1,684,785ක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි රු.34,608,887ක් ලෙස ගෙන තිබිමෙන් ලැබිය යුතු අත්තිකාරම් රු.32,924,102ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඊ) දේශීය ණය හා සංවර්ධන අරමුදලට ගෙවිය යුතු රු.100,025,414ක ණය මුදල් නොගෙවීම පිළිබඳව සභාවට එරෙහිව මහාධිකරණයේ පවරා ඇති නඩු දෙකක් සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි.

1.3.2 **නොසැසඳුනු පාලන ගිණුම්**

-----------------------------

බස් නැවතුම් පොළ ඉදිකිරීම සඳහා දේශීය ණය හා සංවර්ධන අරමුදලෙන් ලබා ගත් ණය වෙනුවෙන් 2015 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු පොළිය රු.51,113,141 ක් ලෙස ගිණුම්ගත කර තිබුණ ද, දේශීය ණය හා සංවර්ධන අරමුදලේ ශේෂ සහතිකය අනුව ගෙවිය යුතු පොළිය රු.72,967,863 ක් ලෙස දක්වා තිබීමෙන් එම ගිණුම් අතර රු.21,854,722 ක වෙනසක් නිරීක්ෂණය විය.

1.3.3 **ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

-------------------------------------

මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2015 දෙසැම්බර් 31 දිනට අදායම් ණය ගැතියන් 96 ක ගෙන් වර්ෂ 4 කට වැඩි කාලයක සිට අයකරගත යුතු එකතුව රු.1,055,770 ක් අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) 2013 වර්ෂයේ දෙවන කාර්තුවේ සිට අය කරන ලද රු.1,231,849ක් වූ ජාතිය ගොඩනැගීමේ බදු සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඇ) ඉකුත් වර්ෂ වලට අදාල එකතුව රු.730,201ක් වූ පළාත් පාලන විශ්‍රාම වැටුප් දායක මුදල් විශ්‍රාම වැටුප් දෙපාර්තුමේන්තුවට ප්‍රේෂණය කර නොතිබුණි.

(ඈ) දේශීය ණය හා සංවර්ධන අරමුදලෙන් බස් නැවතුම්පොල සහිත වෙළඳ සංකීර්ණය ඉදි කිරිම සඳහා ලබා ගත් ණය වෙනුවෙන් 2008 වර්ෂයේ සිට ගෙවිය යුතු ණය වාරික සහ පොළිය එකතුව රු.116,270,592ක් ගෙවීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

1.3.4 **විගණනය සඳහා සාක්ෂි නොමැති වීම**

-------------------------------------

අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා රු.386,323,617ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සංනිරීක්ෂණය කිරීමට නොහැකි විය.

1.3.5 **නිතී රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම**

පහත සඳහන් අනුකූල නොවීම් විගණනයේ දී නිරීක්ෂණය කරනු ලැබේ.

| නිතී රීති,රෙගුලාසිහා කළමනාකරණ තීරණ වලටයොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) ශ්‍රිලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ XIX වැනි පරිච්ඡේදය | |
| 5.6 වගන්තිය | ජලය හා විදුලිය සහිත නිලනිවාස වල මාසික ආර්ථික කුලිය රීති ප්‍රකාරව තක්සේරුකරු විසින් තක්සේරු කර තිබුණද, සභා තීරණය අනුව රු.1,500ක මාසික කුලියක් අය කිරිමට කටයුතු කර තිබුණි. |
| (ආ) සබරගමුවපළාතේ පළාත් සභාවේ මූල්‍ය රීතී සංග්‍රහය | |
| 261.2.7 රීතිය | සමාලෝචිත වර්ෂයේදී නිකුත් කරන ලද එකතුව රු.171,000 ක අතුරු අග්‍රිම විගණිත දිනය වු 2016 අප්‍රේල් 04 දක්වා නිරවුල් කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු. 7,875,002 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ආදායමට වඩා වැඩි වු පුනරාවර්තන වියදම රු.7,159,897ක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.15,034,899 වර්ධනයක් ඇති වී තිබුණි.

### 2.2 අදායම් පරිපාලනය

මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2013 වර්ෂයේසිටගෙවියයුතුරු.1,568,768 ක මුද්දර ගාස්තු විගණිත දිනය වු 2016 අප්‍රේල් 04 දින දක්වා අය කර ගැනීමට අවශ්‍ය ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි.

(ආ) 2015 වර්ෂයට අදාල ලැබිය යුතු මුද්දර ගාස්තු හදුනාගෙන සබරගමුව පළාත්සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් ලබා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඇ) 2015 ඔක්තෝම්බර් සිට 2015 දෙසැම්බර් දක්වා අයවිය යුතු උසාවි දඩ මුදල් හදුනාගෙන සබරගමුව පළාත් සභාවේ ප්‍රධාන ලේකම් වරයාගෙන් අය කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයට පෙර වර්ෂ සඳහා හිඟව තිබූ වරිපනම් බදු රු.4,611,698කශේෂයකින් රු.3,120,187ක් එනම් සියයට 68ක් අය කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඉ) 2015 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු එකාබද්ධ අයබදු රු.1,173,473 ක්, කඩකාමර කුලී රු.175,196 ක්,යන්ත්‍ර කුලී රු.87,308 ක් සහ ගලි බවුසරය සඳහා වූ කුලිය රු.71,450 ක් අයකර ගැනීමට විගණිත දිනය වූ 2016 අප්‍රෙල් 04 දක්වා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

------------------------------

### 3.1 කළමණාකරන අකාර්යක්ෂමතා

------------------------------------

මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2014 වර්ෂයේ තැන්පත් කළ නමුත් උපලබ්ධි වී නොමැති රු.6,858ක් වටිනා චෙක්පත් දෙකක් සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග විගණිත දිනය වූ 2016 අප්‍රේල් 04දින දක්වාම ගෙන නොතිබුණි.

(ආ) වර්ෂ දෙකකට වැඩි කාලයක සිට පැවති බැකෝ ලෝඩර් යන්ත්‍රය කුලියට දීමෙන් ලැබිය යුතු එකතුව රු.73,608 ක් සමාලෝචිත වර්ෂය තුළ දී පොත් වලින් කපා හැර තිබුණි.

### 3. 2 නගර සභා තානායම

----------------------

නගර සභාව මගින් පවත්වාගෙන යනු ලබන තානායම සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) නගර සභාව මගින් පවත්වාගෙන යනු ලබන තානායමේ 2015 ජුනි 29 දින රට බීම සම්බන්ධයෙන් සිදු කළ භෞතික තොග සත්‍යාපනයේදී රු.22,504 ක් වටිනා රට බීම බෝතල් 25 ක තොග අතිරික්තයක් පැවතීමෙන් නීත්‍යානුකූල නොවන අයුරින් රට බීම අලෙවි කිරීම විගණනයේදී මතභේදයට තුඩුදුන් ගනුදෙනුවක් ලෙස නිරීක්ෂණය කරනු ලැබේ.

(ආ) රට බීම පිරිවැයට වඩා අඩුවෙන් විකිණීම හෝ ඉන්වොයිස් කිරීමකින් තොරව විකිණීම හේතුවෙන්2014 වර්ෂයේ ජනවාරි ,මාර්තු සහ දෙසැම්බර් මාසවල රට බීම හලේ එකතුව රු.355,544 ක දළ අලාභයක් වාර්තා වී තිබුණි.

(ඇ) 2014 ජනවාරි සිට 2015 මැයි දක්වා කාලය තුලදී රට බීම හලේ මාසික දළ ලාභ අනුපාතිකය සියයට 88 සිට සියයට ඍණ 110 දක්වා පරාසයක විචලනයක් නිරීක්ෂණය විය.

(ඈ) උත්සව අවස්ථාවලදී සපයනු ලබන ආහාර වට්ටෝරු සඳහා පිරිවැය ඇස්තමේන්තු අනුව මිල ගණන සංශෝධනය කිරීමට 2011 වර්ෂයේ සිට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

### 3.3 මානව සම්පත් කළමනාකරණය

-----------------------------------

අනුමත කාර්යය මණ්ඩලයේ ලේකම් තනතුර ඇතුළුව සංවර්ධන නිලධාරී තනතුරු දෙකක්, ආදායම් පරීක්ෂක තනතුරක්හා ඖෂධ සංයෝජක තනතුරක් පුරප්පාඩුව පැවතිණි.

### 3.4 නිෂ්ක්‍රීය වත්කම්

-------------------

2014 වර්ෂයේ දී සභාවට පරිත්‍යාග වශයෙන් ලැබී තිබුණ මෝටර් ග්‍රේඩර් යන්ත්‍රය කිසිදු ප්‍රයෝජනයකට නොගෙන නිෂ්ක්‍රීයව පවතින බව නිරීක්ෂණය විය.

04. **පද්ධති හා පාලනය**

**------------------------**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) ආදායම් පරිපාලනය
(ඇ) ගබඩා පාලනය
(ඈ) මානව සම්පත් කළමනාකරණය
(ඉ) වත්කම් කළමනාකරණය